# නූතන සාමාජ ප්‍රවණතා මගින් ශ්‍රී ලංකාවේ පාරම්පරික උරුම හා සංස්කෘතික අගයන් මත ඇතිකරන බලපෑම පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

එම්.ආර්.ටී ප්‍රමෝද්‍යා[1], එස්.ඒ.එස් උදේශිකා[2]

ප්‍රමුඛ පද: නවීන සමාජීය ප්‍රවණතා, පාරම්පරික උරුමය, සංස්කෘතික අගයන්, මනෝවිද්‍යාත්මක බලපෑම්, තරුණ පරපුර

## හැඳින්වීම

නවීන සමාජය තුළ සමාජ මාධ්‍ය, නව විලාසිතා, තාක්ෂණික ප්‍රගතිය සහ ගෝලීයකරණය මගින් විශාල වෙනස්කම් සිදුවේ. මෙම වෙනස්කම් මගින් පුද්ගලයන්ගේ අගය, පද්ධති, හැසිරීම් රටා සහ සංස්කෘතික අනන්‍යතාවය වෙනස් වනු ලබන අතර ශ්‍රී ලංකාව වැනි ඓතිහාසික හා සංස්කෘතික උරුමයන්ගෙන් පරිපූර්ණ රටක් තුළ, නවීන සමාජීය ප්‍රවණතා උරුමය හා පාරම්පරික වටිනාකම් මත ඇති කරන මනෝවිද්‍යාත්මක බලපෑම පරීක්ෂා කිරීම ඉතා වැදගත් වේ. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ නවීන සමාජීය ප්‍රවණතා මගින් තරුණ පරපුරේ සංස්කෘතික අගයන් හා පාරම්පරික වටිනාකම් පිළිබඳව මනෝභාවයන්ට ඇති වෙනස්කම් විශ්ලේෂණය කිරීමයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ නවීන සාමාජීය ප්‍රවණතා මගින් ශ්‍රී ලාංකික පාරම්පරික උරුම සහ සංස්කෘතික අගයන් මත ඇතිවන මනෝවිද්‍යාත්මක බලපෑම් විමර්ශනය කිරීමයි. ඒ අනුව කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල විශ්ව විද්‍යාල සිසුන් 60 දෙනෙකු අහඹු ලෙස තෝරා ගන්නා ලදී. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස මිශ්‍ර ක්‍රමවේදය යොදාගත් අතර ප්‍රශ්නමාලා ක්‍රමය (Questionnaire Method) හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Interview) භාවිත කරමින් සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත රැස් කර ගන්නා ලදී. මෙහිදී ප්‍රශ්න මාලා ක්‍රමය තුළ සමාජ මාධ්‍ය භාවිතය, විදේශීය සංස්කෘතිය පිළිබඳව අදහස් හා පාරම්පරික වටිනාකම් පිළිබඳව අදහස් ඇතුළත් වූ අතර එමගින් දත්ත රැස් කර ගැනීම සිදුවිය.

[1,2] දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
Pramodyat211@gmail.com

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ ප්‍රතිඵල ලෙස නවීන සමාජය තුළ විදේශීය විනෝදාත්මක මාධ්‍ය, සමාජ මාධ්‍ය හා නව විලාසිතා යනාදිය මගින් සමාජ සාමාජිකයන්ගේ සංකල්ප හා හැසිරීම් රටාව දැඩි ලෙස වෙනස් වී ඇති බවත් සහ පර්යේෂණයට සහභාගී වූ විශාල ප්‍රමාණයක පුද්ගලයන් පෙන්වා දුන්නේ ඔවුන්ගේ පාරම්පරික වටිනාකම් පිළිබඳව අවධානය අඩුවී ඇති බවයි. එපමණක් නොව යෞවන පරපුර අතර නව විලාසිතා, විදේශීය විලාසිතාමය හැසිරීම් හා භාෂා පුරුදු බොහෝ විට පාරම්පරික අගයන්ට විරුද්ධ අර්ථ නිරූපණයක් ලබා දෙන බවත්, සමාජ මාධ්‍යය හා විනෝදාත්මක මාධ්‍යයන් මගින් පුද්ගලයන්ගේ ජීවන විලාසය, විලාසිතා තේරීම් සහ සමාජීය හැසිරීම් වෙනස් වී ඇති අතර, එමගින් පාරම්පරික සම්ප්‍රදායන්ට අනුකූල හැසිරීම් අඩුවීමක් සිදුවී ඇත. ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා, පවුල් අගයන් සහ විශේෂයෙන් සංස්කෘතික උරුම පිළිබඳ ගෞරවය යන අංග මත ද විකෘති බලපෑමක් ඇතිවී ඇති බව පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් අනාවරණය විය. එමෙන්ම නවීන විලාසිතා මගින් පුද්ගලයන්ගේ හැසිරීම, විලාසිතා සහ සමාජීය අනුරූපණය විදේශීය පුරුදු වලට ගෙනයන බව ද අනාවරණය විය. එසේම, සාකච්ඡා දත්ත අනුව දැක්වෙන්නේ නවීන තාක්ෂණය හා විදේශීය සමාජ මාධ්‍යය විශාල ලෙස යෞවනයන්ගේ සමාජ අත්දැකීම්, අධ්‍යාපනික අවධානය සහ පාරම්පරික සදාචාරාත්මක සිතිවිලි මත බලපෑමක් ඇති කරන බවයි.

එමෙන්ම සමාජ මාධ්‍ය පරිශීලනය වැඩි වීමත් සමඟ සම්ප්‍රදායික සම්බන්ධතා අඩුවී යාම, පවුල් එකමුතුභාවය අඩුවීම සහ විදේශීය ආකල්ප අනුගමනය කිරීම වැනි ප්‍රවණතා බොහෝ විට සමාජයේ සාර්ථක පුරෝගාමීත්වයටත් සමාජීය ව්‍යුහයන්ටත් අභියෝගයක් වී ඇත. නමුත් සමහරුන් පෙන්වා දුන්නේ නවීන ප්‍රවණතා නිසා සමාජය තුළ විවෘත අදහස් හා විචාරාත්මක සිතිවිලි වර්ධනය වූ බවත්, එය නව සමාජ ගොඩනැගීමකට ද දායක වූ බවත්ය. මෙහි ප්‍රතිඵල වලට අනුව සාකච්ඡා කරනු ලබන්නේ නවීන සමාජීය විකාශන තත්ත්වය සමාජ සංස්කෘතිය වෙනස් කරනවා ද නැතහොත් එය අලුත් ආකාරයක සංස්කෘතික ඒකාබද්ධත්වයක් ඇති කරන්නේ ද යන කරුණයි. නවීන තාක්ෂණය සහ විදේශීය විලාසිතා විශේෂයෙන් යෞවනයන්ගේ මනෝභාව හා හැසිරීම මත බලපාන අතර, ඒ මගින් පාරම්පරික අගයන් අලුත් අර්ථකථන බවට පත් වී ඇති බවත් අනාවරණය කර ගත හැකි විය.

## සමාලෝචනය

මෙම පර්යේෂණයෙන් අනාවරණය වූයේ නවීන සාමාජීය ප්‍රවණතා මගින් ශ්‍රී ලංකාවේ පාරම්පරික උරුම සහ සංස්කෘතික අගයන් මත දැඩි බලපෑමක් ඇතිවී ඇති බවයි. විශේෂයෙන් තරුණ පරපුර අතර නවීන විලාසිතා, සමාජ මාධ්‍ය, විදේශීය සංස්කෘතික ආකල්ප සහ තාක්ෂණික වාණිජකරණය ඔවුන්ගේ

මනෝභාවය, හැසිරීම් රටා සහ සංස්කෘතික අනන්‍යතාවය මත විශාල බලපෑමක් ඇති කර ඇත. එමඟින් පාරම්පරික වටිනාකම් හා නවීන සංස්කෘතික බලපෑම් අතර ගැටුමක් පවතින අතර, සමහරුන් නව සංස්කෘතික විලාසිතා පිළිගනිමින් පාරම්පරික අගයන් අමතක කරන බවත් තවත් පිරිසක් තම උරුමය හා සංස්කෘතිය ආරක්ෂා කිරීමට උත්සාහ කරන බවත්ය. එබැවින්, නවීන සමාජීය බලපෑම් ප්‍රතික්ෂේප නොකළ යුතු අතර ඒවා පාරම්පරික අගයන් සමඟ සමතුලිතව ගැලපෙන ආකාරයකින් භාවිත කළ යුතුය. මෙම පර්යේෂණයෙන් ලබාගත් තොරතුරු අනුව නිගමනය කළ හැක්කේ නවීන සාමාජීය ප්‍රවණතා මගින් තරුණ පරපුරේ සංස්කෘතික ගෞරවය හා පාරම්පරික වටිනාකම් පිළිබඳව හැඟීම් ක්‍රමයෙන් පහළ යාමක් දක්වන බවත්, එමඟින් ජාතික අනන්‍යතාවයට හා සංස්කෘතික ඒකාබද්ධතාවයට අභියෝගයක් ඇතිවිය හැකි බවත්ය. ඒ අනුව යෝජනා කළ හැක්කේ අධ්‍යාපන පද්ධති තුළ පාරම්පරික උරුමය සහ සංස්කෘතික අගයන් පිළිබඳව විෂයමාලා ශක්තිමත් කිරීම, තරුණ පරපුරට ජාතික අනන්‍යතාව පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබාදීම යනාදී යෝග්‍ය ක්‍රියාමාර්ග දැක්විය හැකිය.

ආශ්‍රිත මූලාශ්‍රය

ජයතිලක, එම්. (2019). ***ගෝලීයකරණය හා ශ්‍රී ලාංකීය සංස්කෘතිය.*** කොළඹ: සරසවි ප්‍රකාශකයෝ.

විජේසිංහ, පී. (2020). ***පාරම්පරික වටිනාකම් සහ නව සමාජ ප්‍රවණතා.*** සමාජ විද්‍යා සඟරාව.

රත්නායක, එල්. (2018). ***තාරුණ්‍යයේ සංස්කෘතික අනන්‍යතාව හා මාධ්‍ය බලපෑම*** කොළඹ: කාන්තා අධ්‍යයන පර්යේෂණ මධ්‍යස්ථානය.